දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600 / 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169 / 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/05-01-71/01/2013
ඔබේ අංකය / உமது இல. / Your No.: BC/E/01/04/04(II)
දිනය / திகதி / Date: 2020.08. 19

2651 ... 2020
27 AUG 2020

අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

**<u>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති නිලධාරි සේවා ගණය සඳහා වන සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2020.07.07 දිනැති ලිපිය හා බැඳේ.

02. යොමුගත ලිපියේ සඳහන් කරුණු සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 2014.01.17 දින මෙම කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද නීති නිලධාරි සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සඳහා මෙහි ඇමුණුම 1 හි (පිටු 03 කින් සමන්විත) සඳහන් සංශෝධනයන් ඇතුළත් කිරීමට 2020.08.18 දින අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධනයන් බඳවා ගැනීම් පටිපාටියට ඇතුළත් කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.ඩී.පී.එස්. ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්

I. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - කරු. දැන ගැනීම සඳහා
II. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කරු. දැන ගැනීම සඳහා

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි

නීති නිලධාරී සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

2 වන සංශෝධිත ලැයිස්තුව

| අනු අංකය | වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|---|
| 01 | 1.3 | සඳහන් කර ඇති යොමු අංක හා දිනයන්ට පහළින්<br>DMS/1012 2015.04.21 යන්න ඇතුළත් කරන්න. |
| 02 | 1.6 | යොමු අංකය : PSC/EST/05-01-71/01/2013 දිනය : 2014.01.17<br>පළමු සංශෝධනය<br>යොමු අංකය : PSC/ESC/05-01-71/01/2013 දිනය : 2015.03.26<br>දෙවන සංශෝධනය<br>යොමු අංකය : PSC/ESC/05-01-71/01/2013 දිනය : (රා.සේ.කො.ස. විසින් අනුමත කරන දිනය ඇතුළත් කරන්න.) |
| 03 | 05 | වැටුප් පරිමාණය<br>5.1 වැටුප් කේත අංකය : SL-5-2016<br>5.2 වැටුප් පරිමාණය : රු. 58,295 - 5 X 1335 – 5 X 1630 – 15 X 2170 - 105,670<br>5.3 ශ්‍රේණි / තනතුරු ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර<br>(table below) |
| 04 | 06 | සේවා ගණයට අයත් තනතුර / තනතුරු<br>6.1 අනුමත තනතුරු නාම අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්<br>(table below) |

| ශ්‍රේණිය /තනතුර | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (නීති) | පියවර 01 | 58,295 |
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් | පියවර 12 | 75,290 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | පියවර 20 | 92,650 |

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (නීති) | 25 | අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලැබිය හැකි අධිකරණ කටයුතු සහ විමර්ශන සම්බන්ධයෙන් නීති වාර්තා ඉදිරිපත් කිරීම |
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 10 | අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලැබිය හැකි අධිකරණ කටයුතු සහ විමර්ශන |

<table>
<tr><td></td><td></td><td>
<table>
<tr><td>.</td><td></td><td>සම්බන්ධයෙන් නීති වාර්තා ඉදිරිපත් කිරීම</td></tr>
<tr><td>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්</td><td>05</td><td>අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලැබිය හැකි අධිකරණ කටයුතු සහ විමර්ශන සම්බන්ධයෙන් නීති වාර්තා ඉදිරිපත් කිරීම</td></tr>
</table>
6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : සහකාර අධ්‍යක්ෂ (නීති) 25<br>
සහකාර අධ්‍යක්ෂ ජනරාල් 10<br>
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් 05
</td></tr>
<tr><td>05</td><td>7.2.2.1</td><td>අධ්‍යාපන සුදුසුකම්<br>ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම</td></tr>
<tr><td>06</td><td>7.2.2.2</td><td>පළපුරුද්ද<br>
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම<br>
හෝ<br>
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර 03කට නොඅඩු පහත දැක්වෙන් කාර්යයන්වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම<br>
i. නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම<br>
ii. ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු<br>
iii. අදාළ අණපනත් සම්බන්ධව නෛතික කටයුතු<br>
iv. පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු<br>
v. විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු</td></tr>
<tr><td>07</td><td>7.2.4</td><td>බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින්</td></tr>
<tr><td>08</td><td>7.2.4.4</td><td>යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:
<table>
<tr><td>ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ</td><td>උපරිම ලකුණු ප්‍රමාණය</td><td>තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය</td></tr>
<tr><td>1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්</td><td>25</td><td rowspan="5">අදාළ නොවේ.</td></tr>
<tr><td>2. අතිරේක වෘත්තීය පළපුරුද්ද</td><td>35</td></tr>
<tr><td>3. භාෂා හැකියාව</td><td>15</td></tr>
<tr><td>4. තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම</td><td>10</td></tr>
<tr><td>5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය</td><td>15</td></tr>
</table>
</td></tr>
</table>

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136600
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369301, 011-2369305
[redacted] තැපැල / [redacted] / E-mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/05-01-71/01/2013
ඔබේ අංකය / உமது இல. / Your No.: ආ1/බඳ/1
දිනය / திகதி / Date: 2015.03. 27

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

06 APR 2015

අධ්‍යක්ෂ ජනරාල්

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

**<u>සහකාර අධ්‍යක්ෂ(නීති) තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම</u>**

[redacted]

උක්ත කරුණ සම්බන්ධව ඔබේ සමාංක හා 2015.03.18 දිනැති ලිපිය හා බැඳේ.

02 එම ලිපියෙහි දැක්වෙන කරුණු සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව,2014.01.17 දින අනුමත කරන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති නිලධාරී (SL-05) සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියෙහි 7.2.2.1 හා 7.2.4.4 ඡේදයන්,මේ සමඟ එවා ඇති ඇමුණුම 01හි දක්වා ඇති පරිදි සංශෝධනය කිරීම 2015.03.26 දින අනුමත කර ඇති බව එම කොමිෂන් සභාවේ තීරණය පරිදි කාරුණිකව දන්වමි.

[redacted]

ඩබ්.බී.පී. සිල්වා
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

DA/DF
FNA Pls.
for Director General

පිටපත්:

~~ආයුක්ත අධ්‍යක්ෂ ජනරාල්~~

ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව

[redacted]

ඇමුණුම - 01

| අනු අංකය | විෂය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 1. | 7.2.2.1 | අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද: ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥයෙකු වීම.<br>ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් අතිරේක සුදුසුකමක් සේ සැලකේ.<br>ක්ෂේත්‍රයේ ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැලකේ. |
| 2. | 7.2.4.4 යටතේ ඇති වගුව | පහත පරිදි සංශෝධනය විය යුතුය. |

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| විෂයානුබද්ධ ක්‍රියා කාරකම් | 20 | |
| නීතිඥයෙකු ලෙස නීති ක්ෂේත්‍රයේ පළපුරුද්ද-<br>01. අධිකරණයේ නඩු මෙහෙයවීමේ පළපුරුද්ද<br>02. නීති නිලධාරියෙකු ලෙස නීතිපති දෙපාර්තමේන්තුවේ නොවන රාජ්‍ය ආයතනයක පළපුරුද්ද<br>03. නීතිපති වෙනුවෙන් නඩු පැවරීම හා පෙනී සිටීම වෙනුවෙන් ලබා ඇති පළපුරුද්ද | 20 | |
| අපරාධ නීතිය, කාලීන නීති ගැටළු, නව අණ පනත් පිළිබඳව සහ අල්ලස් හෝ අපරාධ කටයුතුවල අදාළ නඩු තීන්දු සම්බන්ධ දැනුම | 20 | |
| භාෂා ප්‍රවීණතාවය | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 10 | |
| එකතුව | 100 | |

27/03

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි
නීති නිලධාරි සේවා ගණය සඳහා වන
බඳවාගැනීමේ පරිපාටිය

01 සම්බන්ධ වන ආයතන

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | යොමු අංකය: | අ 1/බ.ගැ./01 | දිනය: | 2013.11.20 |
| 1.2 | අමාත්‍යාංශය:- - | යොමු අංකය: | - | දිනය: | - |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම. | යොමුඅංකය: | BD/355/267/G<br>DMS/CTABC/01වෙ01<br>DMS/C3/31/3 | දිනය: | 1995.01.17<br>2006.02.02<br>2012.12.19 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල් ගේ නිර්දේශය:- | යොමු අංකය: | EST-3 /RECRU/ 02/1021 | දිනය: | 2013.11.05 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය:- | යොමු අංකය: | NSCC/10/87/SR | දිනය: | 2013.10.21 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය: | PSC/EST/05-01-71/01/2013 | දිනය: | 2014.01.17 |

02 පත්කිරීම් බලධරයා :- රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර:

3.1 සේවා ගණය :- නීති නිලධාරි

3.2 ශ්‍රේණි /තනතුරු :- සහකාර අධ්‍යක්ෂ(නීති), සහකාර අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය: අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලැබිය හැකි අධිකරණ කටයුතු සහ විමර්ශණ සම්බන්ධයෙන් නීති වාර්තා ඉදිරිපත් කිරීම

3.4 කාර්යයන් පැවරීම :- මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් නිලධාරියා දරණ තනතුර අනුව අදාල කාර්යයන් දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබේ.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය :- ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප් පරිමාණය:-

5.1 වැටුප් කේත අංක :- SL - 5 -2006

5.2 වැටුප් පරිමාණය :- රු.28,095 - 5 × 645 - 5 × 790 – 15×1050-51,020/=

5.3 ශ්‍රේණි/තනතුරු ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :-

| ශ්‍රේණිය/තනතුර | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය ( රු. ) |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (නීති) | පියවර 01 | 28,095 |
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් | පියවර 12 | 36,320 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | පියවර 20 | 44,720 |

**06.** සේවා ගණයට අයත් තනතුර / තනතුරු :-

6.1 අනුමත තනතුරු නාම අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :-

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (නීති) | 20 | අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලැබිය හැකි අධිකරණ කටයුතු සහ විමර්ශණ සම්බන්ධයෙන් නීති වාර්තා ඉදිරිපත් කිරීම |
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 04 | අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලැබිය හැකි අධිකරණ කටයුතු සහ විමර්ශණ සම්බන්ධයෙන් නීති වාර්තා ඉදිරිපත් කිරීම |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 03 | අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලැබිය හැකි අධිකරණ කටයුතු සහ විමර්ශණ සම්බන්ධයෙන් නීති වාර්තා ඉදිරිපත් කිරීම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- සහකාර අධ්‍යක්ෂ (නීති) 20
සහකාර අධ්‍යක්ෂ ජනරාල් 04
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් 03

**07.** බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාල නොවේ |
| කුසලතා | අදාල නොවේ |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය:- සහකාර අධ්‍යක්ෂ (නීති)

7.2.2 සුදුසුකම් :-

7.2.2.1 අධ්‍යාපන/වෘත්තිය සුදුසුකම්: අවුරුදු දෙක (02) කට නොඅඩු පළපුරුද්දක් ඇති ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු වීම.

7.2.2.2 කායික සුදුසුකම්:- සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.3 වෙනත් :- (අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය

(ආ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය

(ඇ) අයදුම්කරු හෝ පවුලේ අයකු ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරු වී නොතිබිය යුතුය.

(ඇ) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් නිසි ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :-

7.2.3.1 අවම සීමාව :- අවු.22

7.2.3.2 උපරිම සීමාව :- අවු. .45

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

7.2.4.1 ලිඛිත විභාගය :- අදාළ නොවේ

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය :- අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :- අදාල නොවේ

II	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ SL-05 වැටුප් කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර 17 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III	අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV	උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

11.2.2 තනතුරට පත් කිරීම :-

ඉහත සුදුසුකම් ලත් අයදුම්කරුවන් ඇමුණුම III යටතේ දක්වා ඇති පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේදී පරීක්ෂාවට භාජනය කර සේවා පළපුරුද්ද හා කුසලතාවය පදනම් කරගෙන ලබා ගන්නා ලකුණුවල මුළු එකතුවෙහි කුසලතා අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කරනු ලැබේ.

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි** :- අදාළ නොවේ.

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ** :

සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන් රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**14. තනතුරුවලට අන්තර්ග්‍රහණ ක්‍රමවේදය** :-

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති SL-05-2006–A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සේවය කරන නිලධාරීන් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව දැනට දරන තනතුරුවලටම අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත්කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

15. සැම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති දැක්වෙන අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීමට, මේ පරිපාටියේ විධිවිධාන සළකා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ

සකස් කලේ : අත්සන:- Karuna ...........

( විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා )

නම : ....................

තනතුර : ....................

දිනය : ....................

පරීක්ෂා කලේ :අත්සන:- ....................

( මාණ්ඩලික නිලධරයා )

නම : ....................

තනතුර : ....................

දිනය : ....................

මාණ්ඩලික සහකාර
අල්ලස් හෝ දූෂණ චෝදනා ...
කොමිෂන් සභාව,
අංක : 36, මලලසේකර මාවත,
කොළඹ 07.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ....................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා )

නම : ....................

තනතුර : ....................

දිනය : 2014-3-27

නිල මුද්‍රාව: ....................

... ආර්.එස්.ඒ. අධිකාරී
අධ්‍යක්ෂ (...)
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව,
36, මලලසේකර මාවත,
කොළඹ 07.

යොමු අංකය: ආ 1/බ.ගැ./01

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි නීති නිලධාරි සේවා ගණය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ....................

....................

ලේකම්
....................අමාත්‍යාංශය

ලක්ෂ්මි ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
අංක. 36, මලලසේකර මාවත,
කොළඹ 07.

දිනය : 2014.04.04

නිල මුද්‍රාව: ....................

යොමු අංකය: PSC/EST/05/01-71/01/2014

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි නීති නිලධාරි සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2014.01.17 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : ....................

නම : ....................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2014/05/16

නිල මුද්‍රාව: ....................

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

ඇමුණුම II

01. පරීක්ෂණයේ නම :- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති නිලධාරි සේවා ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02. පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|
| 01 සේවා පළපුරුද්ද<br>(අදාළ තනතුරට සුදුසුකම් ලබන සේවා කාලයට පසුව සම්පූර්ණ කරන එක් වසරක් සඳහා ලකුණු 10 බැගින්) | 50 | අදාළ නොවේ |
| 02 කුසලතාවය | 50 | |
| එකතුව | 100 | |

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා :- රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්.

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :-

පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය මත.